# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## මෛත්‍රීපාල සේනානායක පදනම (සංස්ථාගත කිරීමේ)

**මෛත්‍රීපාල සේනානායක පදනම සංස්ථාගත කිරීම
සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

දිගාමඩුල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය විසින්
2011 පෙබරවාරි මස 09 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2011 ජනවාරි මස 31 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

**[72 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 8.00 යි** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

PL 005501—750 (2011/02)

# මෛත්‍රීපාල සේනානායක පදනම (සංස්ථාගත කිරීමේ)

## මෛත්‍රීපාල සේනානායක පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

*පූර්විකාව.*

"මෛත්‍රීපාල සේනානායක පදනම" යනුවෙන් හඳුන්වනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුකූලව, එකී පදනමට සම්බන්ධ සියලු කරුණු හා පරමාර්ථ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ මැදවච්චිය ඡන්ද කොට්ඨාසයේ කැබිතිගොල්ලෑව, කිවුලේකඩ "සිරිමැදුර" යන ස්ථානයේ පිහිටුවා තිබූ හෙයින් ද :

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කරුණු එකී පදනම විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

*ලුහුඬු නාමය.*

1. මේ පනත 2011 අංක    දරන මෛත්‍රීපාල සේනානායක පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*මෛත්‍රීපාල සේනානායක පදනම සංස්ථාගත කිරීම.*

2. මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින්මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) මෛත්‍රීපාල සේනානායක පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් "මෛත්‍රීපාල සේනානායක පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

*සංස්ථාවේ පොදු පරමාර්ථ.*

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

2- PL 005406 -75 (2010/12)

(අ) මෛත්‍රීපාල සේනානායක පදනමට, ලංකා ලක්ෂ්මි කාන්තා සංවිධානය, සෙනුරි මිනුරි පදනම යන සමාජ සංවර්ධන සංවිධාන අනුබද්ධ කෙරෙනු ඇත ;

(ආ) ශ්‍රී ලාංකීය අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ දැනුම, කුසලතාව හා අවබෝධය වැඩිදියුණු කර ගැනීමට ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා අවශ්‍ය වන්නා වූ අධ්‍යාපනික වැඩමුළු හා වැඩසටහන් සංවිධානය කර පැවැත්වීම, විශේෂ දක්ෂතා ඇති ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා විශ්වවිද්‍යාල අධ්‍යාපනය දක්වා වූ ශිෂ්‍යත්ව වැඩසටහන් ඇති කිරීම, ඔවුන්ට ත්‍යාග, සහතික සහ අනෙකුත් ප්‍රදානයන් පිරිනැමීම, දහම් පාසල් හා පෙර පාසල් නගාසිටුවීමට ආධාර උපකාර කිරීම ;

(ඇ) බෞද්ධ, හින්දු, ඉස්ලාම් හා කතෝලික ආගම් හා සම්බන්ධ ආගමික හා සංස්කෘතික කටයුතුවල දී ඒවායේ ප්‍රවර්ධනය සඳහා හැකි පමණින් ආධාර අනුබල දීම හා එකී ආගමික සමාජ අතර අන්‍යෝන්‍ය අවබෝධය, විශ්වාසය සහ සමගිය ගොඩනැංවීම ;

(ඈ) නාගරික, ග්‍රාමීය, වතු ආශ්‍රිත ප්‍රදේශ ආවරණය වන පරිදි මූලික සෞඛ්‍ය අවශ්‍යතාවන් පිළිබඳව එම ප්‍රදේශවල ජනතාව දැනුවත් කිරීම, ස්වාභාවික පරිසරය ආරක්ෂා කරගැනීම සඳහා වැඩසටහන් සංවිධානය කිරීම, සෞඛ්‍යය හා පරිසරයේ ආරක්ෂාව ඇති කර ගැනීම පිණිස හැකි අයුරින් පහසුකම් සැලසීම ;

(ඉ) දිළිඳුකම අවම කිරීම හා දිළිඳු පවුල් සවිබල ගැන්වීම සඳහා වැඩසටහන් සංවිධානය කර ක්‍රියාත්මක කිරීම, ස්වයං රැකියා උත්පාදනය සඳහා ඔවුන්ට රැකියා ව්‍යාපෘති හඳුන්වා දීම, අඩු ආදායම්ලාභී පවුල්වල රෝගීන්ට පිහිට වීම හා එම පවුල්වල මංගල්‍ය හා අවමංගල්‍ය කටයුතුවල දී පිළිසරණ වීම ;

(ඊ) ශ්‍රී ලාංකීය ජාතික හා සංස්කෘතික උරුම හිමිකම් පිළිබඳ දැනුම හා අවබෝධය හුවමාරු කර ගැනීමේ වැඩසටහන් සංවිධානය කිරීම, එකී උරුමයන් ආරක්ෂා කර ගැනීම හා ඒ සම්බන්ධව සංවිධානය කෙරෙන වැඩසටහන් සාර්ථකව දියත් කිරීම පිණිස රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල ආධාර උපකාර ලබා ගැනීම ;

(උ) නීතියේ රැකවරණය අවශ්‍ය වන්නන් සඳහා නීති පිළිසරණ සේවයක් ස්ථාපිත කර සහාය සැපයීම ;

(ඌ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තහවුරු කර ඇත්තා වූ මූලික අයිතිවාසිකම් හා මානව හිමිකම් ද, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් පිළිබඳ ප්‍රඥප්තීන්හි සඳහන් වන මානව අයිතිවාසිකම් ද යටතේ පුරවැසියන් විසින් තම අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම සඳහා සහාය ඉල්ලා සිටින අවස්ථාවන්හි දී ඒ සඳහා මැදිහත් වී සහාය ලබා දීම ;

(එ) නූතන විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ දැනුම ලබා දෙමින් තරුණ තරුණියන්ගේ බුද්ධිය හා වෘත්තීයමය කුසලතා ඔප්නැංවීම සඳහා වැඩමුළු සංවිධානය කිරීම සහ එම ක්ෂේත්‍රයේ නිරතවන්නන්ගේ නව නිර්මාණ ඇගයීම ;

(ඒ) කාර්මික, ඉදිකිරීම්, තොරතුරු තාක්ෂණය, පරිගණක, ජංගම දුරකථන ඇතුළු රැකියා වෙළෙඳ පොළේ වැඩි ම ඉල්ලුමක් ඇති විවිධ විෂයයන් හා ආශ්‍රිත වෘත්තීය පුහුණුව සඳහා තරුණ තරුණියන්ට අවස්ථාව ලබා දීම, පුහුණුවෙන් පසු ලියාපදිංචි කිරීම හා ඔවුන් දේශීය හා විදේශීය රැකියා අවස්ථාවන් සඳහා යොමු කිරීම;

(ඔ) චිත්‍ර, මූර්ති, කැටයම්, සංගීතය, නැටුම්, ගායනය, නාට්‍ය, ටෙලි නාට්‍ය හා චිත්‍රපට ඇතුළත් සෞන්දර්යාත්මක ක්ෂේත්‍රයන්හි නියැලී සිටින්නන් දිරිමත් කිරීම හා ඔවුන්ගේ නිර්මාණ ඇගයීම සඳහා ජනමාධ්‍ය පහසුකම් සැපයීම;

(ඕ) “ක්‍රීඩා සවිය” නමින් වැඩසටහනක් ආරම්භ කර ජාතික හා ජාත්‍යන්තර ඉලක්ක සපුරා ගත හැකි ක්‍රීඩක ක්‍රීඩිකාවන් ගොඩනැගීම, ජන ක්‍රීඩා ආරක්ෂා කොට ඒවා ජාතික උරුමයන් ලෙස ආරක්ෂා කිරීම පිණිස ජන ක්‍රීඩා සැණකෙළි සංවිධානය කිරීම ; සහ

(ක) ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් සිදුවිය හැකි ආපදා අවස්ථාවන්හි දී ක්‍රියාකාරීව මැදිහත් වී කටයුතු කිරීම සඳහා කැපවීමෙන් කටයුතු කළ හැකි තරුණ තරුණියන්

සිය දෙනකුගෙන් සමන්විත සුවිශේෂී ආපදා කළමනාකරණ භට කණ්ඩායමක් ස්ථාපිත කිරීම, ඔවුන්ට ආපදා කළමනාකරණය පිළිබඳ දැනුම හා පුහුණුව ලබා දීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවේ පරමාර්ථ ඉටු කරගැනීම සඳහා —

(අ) සංස්ථාවේ කාර්යයන් සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිලයට ගැනීමට, අත්කර ගැනීමට, කුලියට ගැනීමට, ඉදි කිරීමට හෝ අන්‍යාකාරයෙන් ලබා ගැනීමට ;

(ආ) බැංකු ගිණුම් විවෘත කිරීමට, පවත්වාගෙන යාමට සහ වසා දැමීමට ;

(ඇ) ඇප හෝ සුරකුම් ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමට හෝ රැස් කිරීමට ;

(ඈ) දේශීය, විදේශීය මුල්‍යමය හෝ වෙනත් ප්‍රදාන සහ පරිත්‍යාග භාර ගැනීමට සහ එකතු කිරීමට ;

(ඉ) අවශ්‍ය නිලධරයන් හා සේවකයන් සේවයේ නියුක්ත කර ගැනීමට, සේවයේ යෙදවීමට, විනය පාලනයට හා සේවයෙන් පහ කිරීමට ; සහ

(ඊ) සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් අවස්ථානුකූලව ප්‍රවර්ධනය කිරීමට හෝ නංවාලීමට අවශ්‍ය කමිටු පිහිටුවීමට හෝ යෝග්‍ය කවර ආකාරයක හෝ සියලු ක්‍රියාකාරකම් කිරීමට, කාරණා ඉටු කිරීමට හා අවශ්‍ය දේවල් ක්‍රියාවේ යෙදවීමට

සංස්ථාවට බලය ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට හා මෙම පනතේ අනෙකුත් විධිවිධානවලට අනුකූලව තෝරාපත් කරගනු ලබන්නා වූ සභාපති, ලේකම්, භාණ්ඩාගාරික, උපසභාපති, උපලේකම්, සංවිධායක හා උපදේශක මණ්ඩලයේ සභාපති යන අයගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලයක් විසින් සංස්ථාවේ කටයුතු පරිපාලනය කළ යුතු ය.

(2) සංස්ථාවේ කාර්යයන් ඉටු කරගෙන යාමේ දී කළමනාකරණ මණ්ඩලය, සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය ලෙස හැඳින්විය යුතුය. කළමනාකරණ මණ්ඩලයේ සභාපතිවරයා සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විය යුතු අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් අතුරෙන් එක් අයකු එහි පරිපාලන කටයුතු භාර අධ්‍යක්ෂවරයා ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කළ යුතු ය. භාණ්ඩාගාරිකවරයා සංස්ථාවේ ගිණුම් කටයුතු පිළිබඳ අධ්‍යක්ෂවරයා ද, උපසභාපතිවරයා, උපලේකම්වරයා, සංවිධායකවරයා සහ උපදේශක මණ්ඩලයේ සභාපතිවරයා සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සෙසු සාමාජිකයන් ද විය යුතු ය.

(3) මෙම වගන්තියේ (1) උපවගන්තියේ පටහැනිව කුමක් සඳහන් වුවද පදනමේ නිර්මාතෘ වන දැනට අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැබිතිගොල්ලෑව කිවුලේකඩ “සිරිමැදුර” ස්ථානයේ පදිංචි පාර්ලිමේන්තු මන්ත්‍රී තිස්ස විජයරත්න කරල්ලියද්ද මහතා සංස්ථාවේ යාවජීව සභාපතිවරයා විය යුතු ය. ඔහුගෙන් පසුව ඔහු විසින් මෙම තනතුර සඳහා වෙනත් කෙනකු පත් කොට නොතිබිණි නම් කළමනාකරණ මණ්ඩලයේ සෙසු සාමාජිකයන් විසින් එම තනතුර සඳහා කෙනකු පත් කළ යුතු ය.

(4) මෙම පනත ක්‍රියාක්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති මෛත්‍රීපාල සේනානායක පදනමේ ධුර දරමින් සිටි සාමාජිකයන්ගෙන් සංස්ථාවේ පළමුවන කළමනාකරණ මණ්ඩලය සමන්විත විය යුතු ය.

උපදේශක මණ්ඩලය.

6. සංස්ථාව උපදේශක මණ්ඩලයකින් ද සමන්විත වේ. උපදේශක මණ්ලයේ සමාජිකයන්ට කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම්වලටත්, මහා සභාවලටත් සහභාගී විය හැකි ය. මෙයට සංස්ථාවේ උන්නතිය සඳහා උපදේශකත්වය ලබාදිය හැකි වනවා මෙන් ම ඉහත රැස්වීම්වල දී අදහස් ද ඉදිරිපත් කළ හැකි ය. එහෙත් යෝජනාවක් ඉදිරිපත් කිරීමට හෝ යෝජනාවක් ස්ථිර කිරීම සඳහා ඡන්දය පාවිච්චි කිරීමට බලය නොමැත.

සංස්ථාවේ රීති.

7. (1) සංස්ථාව විසින් යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක බහුතර ඡන්දයෙන් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල

නොවන පරිදි පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල රීති සෑදීම නිත්‍යානුකූල වන්නේ ය :—

(අ) සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු, ඔවුන් ඇතුළත් කර ගැනීම, ඔවුන් නෙරපීම හෝ ඉල්ලා අස්වීම ;

(ආ) කළමනාකරණ මණ්ඩලය තෝරපත් කර ගැනීම, නිලධරයන් ධුර අත්හැරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ කළමනාකරණ මණ්ඩලයේ නිලතල, කාර්ය සහ චර්යාව ;

(ඇ) සංස්ථාවේ කටයුතු ඵලදායි හා කාර්යක්ෂම ලෙස කරගෙන යාම සඳහා කළමනාකරණ මණ්ඩලය සුදුසු යැයි තීරණය කරන විවිධ ධුර ඇති කිරීම, එම ධුරවලට නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන්ගේ බලතල, කාර්ය, කර්තව්‍ය, වැටුප්, දීමනා හෝ පාරිශ්‍රමික ආදිය තීරණය කිරීම ;

(ඈ) කළමනාකරණ මණ්ඩලයේ හෝ සංස්ථාවේ රැස්වීම්වල දී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම් කැඳවීම් සහ පැවැත්වීම, එම රැස්වීම්වල දී පුරප්පාඩු පිරවීම, දැන්වීම් සහ න්‍යාය පත්‍ර, රැස්වීම් පිළිබඳ ගණපූරණය සහ එහි දී කටයුතු කරගෙන යාම ;

(ඉ) කළමනාකරණ මණ්ඩලයේ, උපදේශක මණ්ඩලයේ සහ සංස්ථාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් හා නුසුදුසුකම්; සහ

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති පදනමේ රීති, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවනතාක් දුරට සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු අතර, එම රීති මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන් එවැනි ම රැස්වීමක දී එවැනි ම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

**සංස්ථාවේ අරමුදල.**

8. (1) සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු අතර, එහි මුදල් වර්ෂය සෑම වර්ෂයක ම ජනවාරි මස 01 වන දින සිට දෙසැම්බර් මස 31 වන දින දක්වා විය යුතු ය.

(2) සංස්ථාව වෙනුවෙන් භාරගනු ලබන ත්‍යාග, රික්තවරණ පැවරීම්, පරිත්‍යාග, සම්මාදම් මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන සංස්ථාවේ කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරනු ලබන බැංකුවක සංස්ථාවේ නමින් තැන්පත් කළ යුතු ය.

**විගණනය සහ ගිණුම්.**

9. (1) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන් :—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු ව සිටින්නේ ද, එමෙන් ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

**සංස්ථාවේ මුද්‍රාව.**

10. සංස්ථාවේ සභාපතිවරයා හා ලේකම්වරයා හෝ සංස්ථාව විසින් යථා පරිදි බලය දෙනු ලැබූ කළමනාකරණ මණ්ඩලයේ වෙනත් යම් තැනැත්තන් දෙදෙනකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර වූ යම් සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි

බවට සලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයේ තම නම අත්සන් කළ යුතු ය. තව ද එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනට පරිබාහිරව විය යුතු ය.

ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

11. අදාළ ව්‍යවස්ථාව මහා සභා රැස්වීමක දී මෛත්‍රීපාල සේනානායක පදනමේ සාමාජිකයන්ගේ තුනෙන් දෙකක බහුතරයකින් සංශෝධනය කළ හැක්කේ ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

12. කළමනාකරණ මණ්ඩලයේ ඒකමතික තීරණය මත සංස්ථාව විසුරුවා හැරිය හැකි ය. තත්කාලයේ පවත්නා සියලු වත්කම් වේතොත් එකී වත්කම් මහභාරකාරතුමාගේ අධීක්ෂණය යටතේ සුදුසු පුණ්‍ය ආයතනයකට හෝ රාජ්‍ය ආයතනයකට ලබාදිය හැක්කේ ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

13. මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන වෙනත් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

14. මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.